**නල්ලූර් ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දින විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නල්ලූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------**

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**------------------------**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා | | | |
| (i) 126 (VIII) වගන්තිය | ප්‍රචාරක දැන්වීම් පුවරු සහ වෙනත් තාවකාලික ව්‍යුහයන් සම්බන්ධයෙන් කිසිඳු අවසර බලපත්‍ර සඳහා ගාස්තුවක් අයකිරීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. බලපත්‍ර සඳහා ගාස්තුවක් අයකිරීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | නියමිත පනත් උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| (ii) පනත158(1) වගන්තිය | හිඟ වරිපනම් බදු ගෙවීම පැහැර හැරි පුද්ගලයන්ට එරෙහිව සභාපතිවරයා විසින් වරෙන්තු නිකුත් කර නොතිබුණි. | නියමිත පනත් උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| (ආ) 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | | | |
| X පරිච්ඡේදයේ 193 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය ඇස්තමේන්තුව සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. | නියමිත රීතින්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී මෙම විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය අමුණනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | පසුගිය වර්ෂ 05 කට අධික කාලයක සිට කාර්යයන් 02 ක් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන්ට ලබාදුන් අත්තිකාරම් නිරවුල් නොකර පැවතුණි. | නියමිත මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | නීතිමය ක්‍රියාමාර්ග මගින් කටයුතු කර ඇත. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | වසර 02 කට අධික කාලයක් පුරා කොන්ත්‍රාත්කරුවන්ගේ තැන්පතු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නියමිත මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | තැන්පත් පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග සිදුකර වාර්තා නිකුත් කරනු ලැබේ. |

**1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.561,941 ක බදු මුදල් හා ඒ සඳහා දඩ මුදල් රු.447,952 ක් ප්‍රාදේශීය සභාව විසින් ගෙවා නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු සඳහා උපදෙස් ලබා වියදම් ලබාගත යුතු වේ. | අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ආ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින වාහන 06 කට අදාළ වර්ෂයේ වාර්ෂික බදු මුදල් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ගෙවා නොතිබුණි. | **බදු මුදල් නියමිත කාලයේ** මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ගෙවීමට කටයුතු කළ යුතු වේ. | අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව අදාල ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වුවත් සභාව විසින් ඒවා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වේ. | තැන්පත් පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග සිදුකර වාර්තා නිකුත් කරනු ලැබේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 36,175,857 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 110,771,569 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,770,000 | - | 2,615,823 | 6,912,056 | 2,615,000 | - | 2,600,466 | 6,879,628 |
| කුලී | 34,513,760 | - | 34,551,173 | 961,238 | 28,585,000 | - | 30,103,144 | 960,238 |
| බලපත්‍ර ගාස්තු | 3,420,000 | - | 3,647,358 | 48,000 | 3,248,700 | - | 3,442,528 | 28,000 |
| වෙනත් ආදායම් | 129,022,790 | - | 94,000,109 | 40,140,428 | 108,764,324 | - | 153,429,111 | 214,646,444 |
| එකතුව | **169,726,550** | **-** | **134,814,463** | **48,061,722** | **143,213,024** | **-** | **189,575,249** | **222,514,310** |

* බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 වර්ෂයේ රැස්කළ ආදායම රු. 189,575,249 ක් වුවත්, 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු.134,814,463 ක් වීමෙන් 2017 වර්ෂය සමඟ සැසඳීමේදී 2018 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.54,760,786 කින් අඩු වී තිබූ බව නිරීක්ෂණය විය. එසේ වුවත්, ආදායම් බිල් කිරීමට අපොහොසත් වීමෙන් අදාළ හිඟහිටි ප්‍රමාණය තහවුරු කරගත නොහැකි වී තිබුණි. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව විසින් පසුගිය වර්ෂ 05 ක් පුරා බිල්කර නොතිබීම මගින් ආදායම් රැස්කිරීමේ අකාර්යක්ෂමතාවය හෙළිදරව් කෙරුණි. | වර්ෂ 05 කට අදාළ බිල්කළ ආදායම පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි අනාගතයේදී ආදායම් නියමිත පරිදි බිල් කර ඉදිරිපත් කෙරේ. |

**2.2.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රු.2,583,823 ක් වටිනා දේපළ 19,594කින් සභාවේ හිඟ දේපල බදු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.4 කුලී මුදල්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වෙළඳපොළ ගොඩනැගිල්ලේ හිඟ කඩකුලී එකතුව රු.544,574 ක් සභාව විසින් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | රු.544,574 ක් කල් ඉකුත් වූ හිඟ ආදායම් වේ. මෙය කපා හැරීමට කටයුතු කරමින් පවතී. |

**2.2.5 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විදුලි සංදේශ කුළුණු සඳහා බලපත්‍ර ගාස්තු රු.200,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විදුලි සංදේශ කුළුණු සඳහා බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. |

### 2.2.6 උසාවි දඩ මුදල් මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.855,000 ක් සහ මුද්දර ගාස්තු රු.15,678,611 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | සුදුසු ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය, මහජන උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳව සියලුම කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍යයෙන් ජනතාවගේ සුබවිහරණය, පහසුකම් හා සුහසාධන සහ ආරක්ෂා කිරීම පිළිබඳව හෙළිවූ කරුණු පහත සඳහන් පරිදි විය.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30 ක් පිළිබඳව අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සියළුම මූලික කරුණු ක්‍රියාත්මක කර නොතිබුණි. | සඳහන් කර ඇති සියළුම කාරණා ක්‍රියාත්මක කිරීමට අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අතුරු ව්‍යවස්ථා සඳහා මූලික කාරණා සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට අනාගතයේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සියළුම ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කර තිබුණි. |

(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ළඟාකර නොගැනීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කුන්දන්පූගල් ඉඩම් මිලදී ගැනීම සඳහා වැයකළ රු.5,354,000 ක් මඟින් අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගත නොහැකි වී තිබුණි. | අදාළ දේපල පිවිසුම් සඳහා මාර්ගයක් දැමීමට කටයුතු කළ යුතු වේ. | මෙම වර්ෂ අවසානය තුළ මාර්ගය දැමීමට කටයුතු කරනු ලැබේ. |

(ඈ) කාර්යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරකම් 11 ක් ආරම්භ කළ නමුත් එම ක්‍රියාකාරකම්වල කාර්යසාධනයේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය. | සඳහන් කළ ක්‍රියාකාරකම් නියමිත කාලය තුළ අවසන් කිරීමට කටයුතු කළ යුතු වේ. | සඳහන් කළ කාර්යයන් වෙනුවෙන් පිළිගත හැකි ප්‍රමාදයට හේතු ඉදිරිපත් කිරීම නිසා කාලය දීර්ඝ කිරීමක් සිදුකළ අතර අමතර දින සඳහා ප්‍රමාද ගාස්තු අයකර ඇත. |

(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඝන අපද්‍රව්‍ය රාජකාරියේ යොදවනු ලබන සෞඛ්‍ය කම්කරුවන් 43 දෙනෙකුට කාලයෙන් කාලයට සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණ සභාව විසින් සිදු කර නොතිබුණි. | සෞඛ්‍ය කම්කරුවන්ට වෛද්‍ය පරීක්ෂණයන් නිවැරදි ආකාරයෙන් සිදුකළ යුතු වේ. | වෛද්‍ය පරීක්ෂණයන් සිදු කිරීමට කටයුතු කර ඇත. |
| (ii) | ජාතික ප්‍රතිපත්තිවලට අනුව ඝන අපද්‍රව්‍ය වෙන් නොකිරීම් සිදුනොකර එකතු කර තිබුණි. | ඝන අපද්‍රව්‍ය වෙන්කිරීම් සිදුකර එකතු කළ යුතු වේ. | ඉදිරි අනාගතයේදී සම්පූර්ණයෙන් වෙන්කිරීම සිදුකර එකතු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (iii) | සෞඛ්‍ය කම්කරුවන්ට සෞඛ්‍යාරක්ෂිත ඇඳුම් ලබා නොදීම හේතුවෙන් සේවකයින්ගේ සෞඛ්‍ය | සෞඛ්‍ය කම්කරුවන්ට සෞඛ්‍යාරක්ෂිත ඇඳුම් සපයා සේවයේ යෙදවීම අවශ්‍ය වේ. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

තත්ත්වය සම්බන්ධයෙන් සභාව අවධානය යොමු කිරීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

**(ඊ) පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නියමිත ක්‍රියාමාර්ග සිදු කළ යුතු වේ. | ක්‍රියාමාර්ගයන් ඉදිරි අනාගතයේදී ගනු ලැබේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවා ලබාගන්නන් ලැයිස්තුවට පටහැනිව ඉල්ලුම්කරුවන් 45 දෙනෙකුට ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතිය මාස 01 – 05 ක් දක්වා ප්‍රමාදයකින් පසුව ලබා දී තිබුණි. | මහජනතාවට සේවාවන් නියමිත කාලයේ සැලසිය යුතු වේ. | නියමිත කාලයේදී මහජනතාවට සේවාවන් සැපයීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග රෝලරය (Roller) වර්ෂයකට අධික කාලයක සිට කුලියට දීමට කටයුතු කර නොතිබුණි. | රෝලර් වාහනය කුලියට දීමට කටයුතු කළ යුතු වේ. | මාර්ග රෝලරය ඉල්ලීම් කළ විට එය කුලියට දීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | වරිපනම් බදු අයකිරීමට වාර්ෂිකව සභාව විසින් දේපල හිමියන්ට K ආකෘති පත්‍ර ලබාදිය යුතු වුවත්, 2018 වර්ෂයේ දේපල සඳහා "K" ආකෘති පත්‍ර නිකුත් කර නොතිබුණි. | "K" ආකෘති පත්‍ර නියමිත කාලයේ නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මානව සම්පත් ලබාගෙන යෙදවීම සිදුකර නොතිබූ බැවින්, එවැනි මානව සම්පත් 12 ක් විසින් නිම කළයුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ භාවිතයේ පවතින වාහන 05 ක් වාහන ලේඛනයේ ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන ලේඛනයේ වාහන අයිතිය ලේඛනගත කිරීමට කටයුතු කළ යුතු වේ. | සඳහන් කළ වාහන 03 ක් සභාවේ වාහන ලේඛනයේ ලේඛනගත කර ඇත. |

### 3.4.2 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරනු ලබන අලුත්වැඩියා කළ යුතු වාහන 06 ක් වර්ෂ 03 කට අධික කාලයක සිට අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියා කළ හැකි වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වේ. | අලුත්වැඩියා කිරිමට කටයුතු කරනු ලැබේ. |

### 3.4.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනතුරුව සිදුකළ කටයුතු වලදී අයිතමයන් 49 ක් සඳහා නිවැරදි | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | වෙන්දේසියේදී මිලදී ගැනීමට කිසිවකුත් ඉදිරිපත් නොවීය. නැවත තක්සේරු කිරීමට දැනුම් |

| | | |
|---|---|---|
| මිල තීරණය නොකිරීම නිසා වෙන්දේසියේදී විකුණා නොතිබුණි. | | දී ඇත. |

**3.5 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම භාණ්ඩ හා සේවා ක්‍රියාවලිය සඳහා පිළියෙල කර තිබිය යුතුවේ. ඒසේ වුවත් සභාව විසින් සේවාවන් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම අනුමත ආකෘතියට අනුව පිළියෙල කළ යුතු වේ. | සේවාවන් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරි අනාගතයේදී පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සේවක වැටුප්, ගමන් වියදම්, මූලධන වත්කම් අලුත්වැඩියා සහ නඩත්තුව, පැටවුම් හා ගොඩබෑම් සන්නිවේදන සම්බන්ධතා සේවාවන් සහ වෙනත් වියදම්, පොලී ගෙවීම්, කොටස් ලාභ, ප්‍රසාද දීමනා, සහනාධාර, උපකාරක මුදල්, විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික වැනි වියදම් හිතකරවත් භාණ්ඩ හා සේවා අවශ්‍යතා, අහිතකරවත් පැවතුණි. | අයවැය ඵලදායී පාලන කාරකයන්ට අනුකූලව සැලසුම් කර සකස් කළ යුතු වේ. | අනාගතයේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |